කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 03 WW/TC/20/05/16/03

වර්ණය : රතු

# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිලිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2020 මැයි මස 16 වන දින පෙ.ව. 10.30 ට නිකුත් කරන ලදී.

ගොඩබිම් ප්‍රදේශ සහ දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

සැලකිලිමත් වන්න!

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති අඩු පීඩන තත්ත්වය පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී අද (16) උදෑසන 05.30 වන විට ත්‍රිකුණාමලය සිට ඊසාන දෙසින් කි.මී 670 පමණ උතුරු අක්ෂාංශ 10.4 ත් නැගෙනහිර දේශාංශ 87.0 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය අද දින තුලදීම සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙමින්, ඊළඟ පැය 24 තුල චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තුවේ.මෙය 17 වන දින දක්වා උතුරට බරව වයඹ දෙසටත් ඉන් අනතුරුව 18 සිට 20 දිනයන් තුලදී උතුරට බරව ඊසාන දෙසට හැරී බටහිර බෙංගාල වෙරළ වෙත ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.

මුහුදු ප්‍රදේශය සඳහා:




| MSW (knot/kmph) | Impact | Action |
|---|---|---|
| 28-33 (52-61) | Very rough seas | Total suspension of fishing operations |
| 34-49 (62-91) | High to very high seas | Total suspension of fishing operations |
| 50-63 (92-117) | Very high seas | Total suspension of fishing operations |
| ≥ 64 (≥118) | Phenomenal | Total suspension of fishing operations |

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150

2020/05/16

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/05/16
Time : 1100 hrs
D (Ops)/DO/ADO

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


අනතුරු ඇඟවීම්:

ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි පැය 24 තුලදී දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 60-70 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී .

මන්නාරම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශ වල මුහුදු රළ මීටර්. (2.0-2.5) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

ගොඩබිම ප්‍රදේශය සඳහා:

බස්නාහිර, සබරගමුව, දකුණ, මධ්‍යම සහ නැගෙනහිර පළාත් වල ඇතැම් ස්ථාන වලට මි.මී.150 ට වැඩි ඉතා තද වර්ෂාපතනයන් ද ඇති විය හැක.

දිවයින හරහා සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩි විය හැක.

අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.
- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

ගොඩබිම ප්‍රදේශය සඳහා:

- කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

මීළඟ නිවේදනය 2020.05.17 දින ප.ව 1.00 ට නිකුත් කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **03**
COLOR: Red

WW/TC/20/05/16/03


## Warning for Heavy rain, Strong winds and Rough seas

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 10.30 a.m. 16th May 2020

### For Land area and Shallow and Deep Sea areas around Sri Lanka

### PLEASE BE AWARE!

The low pressure area over south east Bay of Bengal has developed into a depression and lay centred at 05.30 a.m. of today, the 16th May 2020, near latitude 10.4°N and longitude 87.0°E, about 670 km North-east of Trincomalee. It is very likely to intensify rapidly into a cyclonic storm of today (16th) and further into a severe cyclonic storm during subsequent 24 hours. It is very likely to move north-northwestwards initially till 17th and then re-curve north-northeastwards towards west Bengal coast during 18th to 20th May.




| MSW (knot/kmph) | Impact | Action |
|---|---|---|
| 28-33 (52-61) | Very rough seas | Total suspension of fishing operations |
| 34-49 (62-91) | High to very high seas | Total suspension of fishing operations |
| 50-63 (92-117) | Very high seas | Total suspension of fishing operations |
| ≥ 64 (≥118) | Phenomenal | Total suspension of fishing operations |

2020/05/16

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/05/16
Time : 1100 hrs
DISASTER MANAGEMENT CENTRE
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WARNINGS:

### For Sea Area

Under the influence of the system possibility for heavy showers or thundershowers and sudden roughness, associated with sudden increase of wind speed up to 60-70kmph is high in sallow deep see areas around the island during next 24hours.

There is a possibility that near shore sea areas off the coast extending from Mannar to Pottuvil via Colombo, Galle and Hambanthota may experience surges due to the effect of swell waves, having (2.0-2.5) m height.

### For Land Area

Very heavy falls above **150 mm** can be expected at some places in Western, Sabaragamuwa, Southern, Central and Eastern provinces.

The wind speed can be increased up to (40 -50)kmph at times over the island.

## ACTION SUGGESTED:

### For the Sea area:

- Naval and fishing communities are advised not to venture into the shallow and deep sea areas around the Island until further notice.
- Those who are out at Sea over these regions are advised to return to coasts or moved safer areas immediately.
- Requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.

### For the Land area:

- People living in **hilly areas (particularly landslide prone areas)** are requested to be vigilant.
- Be alert on the advisories issued by the Department of Meteorology.
- For emergency assistance contact the local disaster management authorities.

**The next bulletin will be issued at 1.00 pm at 17th May 2020.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/05/16
Time : 1100hrs
D (Ops)/DC/ADO
DISASTER MANAGEMENT CENTRE